විසර්ජන ශීර්ෂය - 274 - අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2010 වර්ෂය

1. දිස්ත්‍රික් ලේක්ම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(අ). දිළිඳුකම අඩු කිරීමේ මුල පිරීම්, බෙදා හැරීම සහ කළමනාකරණය

(ආ). ආපදා සහන සහ පුනරුත්ථාපන ව්‍යාපෘති පරිපාලනය

(ඇ). සංවර්ධන ව්‍යාපෘතීන් සැලසුම් කිරීම සහ පාලනය කිරීම

(ඈ). මැතිවරණ සම්බන්ධීකරණය

(ඉ). දිස්ත්‍රික් ව්‍යාපෘති පරිපාලනය හා මෙහෙයවීම

(ඊ). ආදායම් එකතු කිරීම

(උ). කොට්ඨාශ මට්ටමේ සහ ගම් මට්ටමේ නිළධාරීන් හා සංවිධාන මගින් රජයේ කටයුතු සමායෝජනය කිරීම හා නීතියෙන් පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම

(ඌ). වෙනත් අමාත්‍යාංශවල හා දෙපාර්තමේන්තුවල නියෝජිතයා ලෙස කටයුතු කිරීම

(එ). පළාත් සභා කාර්යයන්ට සහාය වීම

2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

(අ). නැගෙනහිර නුවරගම් පළාත
(ආ). මධ්‍යම නුවරගම් පළාත
(ඇ). තලාව
(ඈ). ගලෙන්බිඳුනුවැව
(ඉ). මහවිලච්චිය
(ඊ). රඹෑව
(උ). මිහින්තලේ
(ඌ). පලාගල
(එ). නොච්චියාගම
(ඒ). ඉපලෝගම
(ඓ). ගල්නෑව
(ඔ). මැදවච්චිය
(ඕ). පදවිය
(ඖ). පලුගස්වැව
(ක). හොරොව්පොතාන
(ඛ). කැබිතිගොල්ලැව
(ග). කැකිරාව

(ඝ). කහටගස්දිගිලිය
(න). තඹුත්තේගම
(ට). නාච්චාදූව
(ධ). තිරප්පනේ
(ඩ). රාජාංගනය

3. වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් ගිණුම් වර්ෂය ආරම්භයේ පිළියෙල කර නොතිබුණි.

4. ගිණුම්

4.1 මුළු ප්‍රතිපාදනය හා වියදම

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.478,225,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.461,385,136 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ශුද්ධ ඉතිරි කිරීම් රු. 16,839,864 ක් වූ අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් 3.52 % ක් විය . විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 274 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 437,075,000 | 41,150,000 | 421,735,267 | 39,649,869 | 15,339,733 | 1,500,131 |

4.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් පහත සඳහන් පරිදි එකතුව රු.2,087,516,105 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර, ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| ශීර්ෂය අංකය | දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය | ලැබුණු ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය/ අතිරික්තය 2010.12.31 දිනට |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 101 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 755,000 | 695,100 | 59,900 |
| 103 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 84,701 | 68,701 | 16,000 |
| 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 887,029,192 | 752,752,710 | 134,276,482 |
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 5,906,071 | 3,147,964 | 2,758,107 |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | 2,861,084 | 2,424,517 | 436,567 |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 85,500 | 44,246 | 41,254 |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 19,372,774 | 16,704,982 | 2,667,792 |
| 121 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 1,380,916 | 1,243,697 | 137,219 |
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 6,072,061 | 5,893,283 | 178,778 |
| 127 | කම්කරු සබඳතා හා ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 306,000 | 199,326 | 106,674 |
| 133 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 13,598,102 | 10,290,390 | 3,307,712 |
| 134 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 31,750 | 31,250 | 500 |
| 138 | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 62,992,306 | 60,375,306 | 2,617,000 |
| 139 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 86,832 | 86,622 | 210 |
| 142 | ජාතික උරුමයන් හා සංස්කෘතික අමාත්‍යාංශය | 7,038,275 | 7,029,765 | 8,510 |
| 145 | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය | 16,648,214 | 13,356,236 | 3,291,978 |
| 152 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 2,930,483 | 2,662,893 | 267,589 |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 2,620,281 | 2,435,076 | 185,205 |
| 156 | යෞවන කටයුතු අමාත්‍යාංශය | 942,350 | 798,169 | 144,181 |
| 160 | පරිසර අමාත්‍යාංශය | 422,500 | 405,852 | 16,648 |
| 174 | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 861,250 | 861,250 | - |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 10,378,655 | 10,045,564 | 333,091 |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 6,500 | 6,500 | - |
| 210 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 8,000 | 7,957 | 43 |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 4,646,245 | 4,469,575 | 176,670 |

| | | | | |
|---|---|---|---|---|
| 217 | පර්වාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 6,180,565 | 5,779,622 | 400,943 |
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේනතුව | 443,270,303 | 434,422,576 | 8,847,727 |
| 226 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | 225 | 210 | 15 |
| 227 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 28,716 | 22,920 | 5,796 |
| 252 | ජන හා සංඛ්‍යා ලේඛන දෙපර්තමේන්තුව | 2,886,220 | 2,592,951 | 293,269 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 550,648,785 | 511,338,877 | 39,309,908 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 268,800 | 254,992 | 13,808 |
| 286 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 26,301,051 | 25,324,132 | 976,919 |
| 300 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 2,345,072 | 2,327,594 | 17,478 |
| 304 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 935,378 | 596,486 | 338,892 |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 7,585,948 | 7,279,395 | 306,553 |
| | එකතුව | 2,087,516,105 | 1,885,976,686 | 201,539,418 |

4.3 විගණනය හා විෂය පථය

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

4.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම.

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන් රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරී හා ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 4.5 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණ

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) හා (ආ) පොදු නිරීක්ෂණ සහ 4.6 සිට 4.15 දක්වා වූ ඡේදවල ඇතුළත් වෙනත් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙළ කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අග්‍රිම ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අග්‍රිම ගිණුම්වල රු.210,872 ක බැර ශේෂයක් වූ අතර,එකි ශේෂය වර්ෂයකට අධික කාලයක සිට පැවතුණි.

### (ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව 2010 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂයන්ගේ එකතුව රු.4,944,700 ක් වූ අතර, හිඟ හිටීමට බලපා තිබුණු හේතු හා හිඟ හිට තිබුණු කාලපරිච්ඡේදය පිළිබඳ සටහනක් පහත දැක්වේ.

| | හේතුව | කාල විශ්ලේෂණය | | | | |
|---|---|---|---|---|---|---|
| | | වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 ට වැඩි 2 ට අඩු | වර්ෂ 2 ට වැඩි 3 ට අඩු | වර්ෂ 3 ට වැඩි | එකතුව |
| | | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | සේවා ස්ථාන මාරුවීම් | 180,103 | 60,795 | 120,989 | 2,837,165 | 3,199,052 |
| (ii) | මිය යාම් සහ සේවය අතහැර යාම් | - | - | - | 316,765 | 316,765 |
| (iii) | වැඩ තහනම් කළ හා වෙනත් ශේෂ | | 159,397 | | 1,269,486 | 1,428,883 |
| | එකතුව | 180,103 | 220,192 | 120,989 | 4,423,416 | 4,944,700 |

පහත සඳහන් නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(i) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ජේදය ප්‍රකාරව ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ මාස 03 ක් ගතවීමට පෙර නිරවුල් කිරීමට කටයුතු කළයුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිට වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වලට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් 46 දෙනෙකුගෙන් ලැබිය යුතු ණය ශේෂයන්ගේ රු.3,199,052 ක් වූ එකතුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණු අතර, එකී නිරවුල් නොකල ණය ශේෂයන්ගෙන් ඇතැම් ණය ශේෂයන් 1992 වර්ෂයේ සිට අත්තිකාරම් ගිණුමේ ඉදිරියට ගෙන එමින් පැවතුණු බව නිරීක්ෂණය විය.

(ii) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ජේදය ප්‍රකාරව ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ මාස 02 ක් ගතවීමට පෙර නිරවුල් කිරීමට කටයුතු කළයුතු වුවත්, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ස්ථාන මාරු වීම් ලබා පැමිණි නිලධාරීන් 17 දෙනෙකු වෙනුවෙන් පියවිය යුතු ණය ශේෂයන්ගේ රු.1,446,694 ක් වූ එකතුව නිරවුල් කර නොතිබුණි.

(iii) කැකිරාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සිට සේවයෙන් පහ කර ඇති ග්‍රාම නිලධාරීවරයකු විසින් ලබාගත් ණය මුදලින් රු.11,156 ණය ශේෂයක් තව දුරටත් අය විය යුතුව තිබුණි.

## 4.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

### තොරතුරු ඉදිරිපත් නොකිරීම

ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත 2007 වර්ෂයේදී විමධ්‍යගත අයවැය ව්‍යාපෘති යටතේ සහ විවිධ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වලින් ලැබී තිබුණු භාණ්ඩ රාශියක් ගබඩා පරිශ්‍රයේ ගබඩාකර තිබුණු අතර, එකී භාණ්ඩවලට අදාල ලිපි ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 4.7. වත්කම් කළමනාකරණය

### (අ) නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

(i) ප්‍රාදේශීය ලේකම් කාර්යාල තොරතුරු කැඳවීම්වලට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක පහත දක්වා ඇති වත්කම් නිශ්ක්‍රීයව හෝ ඌණ උපයෝජිතව පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | සංඛ්‍යාව | නිශ්ක්‍රීය/ඌණ උපයෝජිතව පැවතියේද යන බව | කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| | වාහන | | |
| ගලෙන්බිදුනුවැව | 01 | නිශ්ක්‍රීය | වසර 05 |
| ඉපලෝගම | 01 | ඌණ උපයෝජිත | වසර 01 |
| පලාගල | 01 | නිශ්ක්‍රීය | 2011 සිට |
| තඹුත්තේගම | 01 | ,, | 2010 ඔක්තෝබර් සිට |

(ii). පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ ශාඛා කාර්යාල පිහිටුවීමට අදාලව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වැඩසටහන යටතේ කහටගස්දිගිලිය, ඉපලෝගම, තලාව, තිරප්පනේ, ගලෙන්බිදුනුවැව, විලච්චිය, ගල්නෑව, නොච්චියාගම, තඹුත්තේගම, මිහින්තලය සහ රඹෑව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා 2008 වර්ෂයේදී රු.7,682,090 ක අනුමත ප්‍රතිපාදන යටතේ රු.7,578,316 ක් ගෙවීම් කර ශාඛා කාර්යාල ස්ථාපිත කර තිබුණු නමුත්, මේ වන විටත් කාර්යාල කටයුතු ආරම්භ කර නොතිබුණි. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් භෞතික හා මානව සම්පත් සහ අවශ්‍ය උපදෙස් ලබා නොදීම මෙම තත්වයට හේතුව බව දිස්ත්‍රික් ලේකම්වරයාගේ පිළිතුර විය.

(ආ) ලැබිය යුතු ශේෂ.

වී මිලදී ගැනීම සඳහා විවිධ ආයතන වෙත නිකුත් කරනු ලබන අත්තිකාරම් මාස 06 ක් තුළ ආපසු අය කර ගත යුතු වුවද දිස්ත්‍රික් ලේකම් විසින් 2001, 2004/2005 හා 2005/2006 වර්ෂ වලදී ආයතන 06 ක් වෙත නිකුත් කර තිබුණු අත්තිකාරම් අයවීම ඉතා දුර්වල තත්ත්වයක පැවතුණු අතර 2010 දෙසැම්බර් 31 දිනට රු.78,274,586 ක අත්තිකාරම් මුදලක් තවදුරටත් අයවිය යුතුව තිබුණි.

(ඇ) නිරවුල් නොකළ අත්තිකාරම්

අනුරාධපුර දිස්ත්‍රික් සමෘද්ධි අධිකාරි කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකළ අවුරුද්දක කාලයක් ඉක්මවා තිබුණු අත්තිකාරම්වල වටිනාකම රු.230,700 ක් විය.

## 4.8 අනුකූල නොවීම්

### නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| | 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනත | 28,070 | අනුරාධපුර දිස්ත්‍රික් සමෘද්ධි අධිකාරිය විසින් 2000 පෙබරවාරි මාසයට අදාළව ගෙවිය යුතු දායක මුදල් යාවත්කාලීනව නොගෙවීම හේතුවෙන් අධිභාර පනවා තිබුණි. |
| | 1935 අංක 5 දරන ආඥා පනතින් සංශෝධිත 1893 උගස් බඩු ගන්නන්ගේ ආඥා පනත | - | උකස් බලපත්‍ර ලබා නොගෙන බඩු උකස් ගැනීමේ ආයතන පවත්වා ගෙන යාම |
| (ආ) | **ආයතන සංග්‍රහය** | | |
| | xix පරිච්ඡේදයේ 3.1 වගන්තිය | - | මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2000 වර්ෂයේ තක්සේරු කුලිය පදනම් කරගෙන මිහින්තලේ ගම්උදා භූමියේ පිහිටි රජයේ නිවාසයක් සඳහා සමාලෝචිත වර්ෂයේදීද තක්සේරු කුලී අයකර තිබුණි. |
| (ඇ) | **මුදල් රෙගුලාසි** | | |
| | මු.රෙ.104(3)හා 104(4) | - | වාහන අලාභහානි සම්බන්ධයෙන් කටයුතු කර අදාළ ප්‍රාරම්භක හා අවසන් වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත එවිය යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිදු වී ඇති වාහන අනතුරු සම්බන්ධයෙන් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | මු.රෙ. 880 | - | කහටගසිදිගිලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තබා නොතිබුණි. |
| | මු.රෙ.1646 | - | කහටගස්දිගිලිය, මහවිලච්චිය, ගලෙන්බිඳුණු වැව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාලව 2010 වර්ෂයේ දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | මු.රෙ.1647(3) | - | අනුරාධපුර දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ වාහනයක් පිළිබඳ තොරතුරු වාහන ලේඛනයක සටහන් කර නොතිබුණි. |
| (ඇ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2.1.1 ජේදය | - | මාස 06 ට වරක් රජයේ වාහන සඳහා ඉන්ධන දැවීම පිළිබඳ පරීක්ෂා කල යුතු වුවත්, අනුරාධපුර දිස්ත්‍රික් සමෘද්ධි අධිකාරිය සහ ඉපලෝගම, තලාව, ගල්නෑව, තිරප්පනේ, තඹුත්තේගම, ගලෙන්බිඳුණුවැව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත, වාහනවල ඉන්ධන දැවීම පරීක්ෂා කර නොතිබුණි. |
| | 2009 ජූනි 12 දිනැති අංක HA/DA/12/27 දරන චක්‍රලේඛය | - | රඹෑව ප්‍රාදේශීය ලේකම් තම නිල නිවසේ පදිංචි වී නොසිටීම නිසා, නිවාසය හානියට පත්ව තිබුණි. |
| (ඉ) | **වෙනත් චක්‍රලේඛ** | | |
| | සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ 2008 ජනවාරි 25 දිනැති අංක MPI/DCM/1/2008 දරන චක්‍රලේඛය | 328,170 | ගොවි සංවිධාන වල පරිහරණය සඳහා ලබාදී තිබුණු උදළු තල 408 ක් ඉපලෝගම, මහවිලච්චිය, ගල්නෑව, තඹුත්තේගම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉන්වෙන්ට්‍රි ලේඛන ගත කර අදාල ගොවිජන කේන්ද්‍රයේ ගබඩා කර තැබිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>3 පරිච්ජේදයේ 3:4 ජේදය | - | සීමිත මිල ගණන් කැඳවීම් කිරීමේදි අවම සැපයුම්කරුවන් 05 දෙනෙකුගෙන් මිල කැඳවීම් සිදුනොකර 02 දෙනෙකුගෙන් පමණක් මිළ ගණන් කැඳවා තිබුණි. |

4.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක් විසින් ඇස්තමේන්තුගත පිරිවැය රු.44,230,961 ක් වූ ව්‍යාපෘති 124 ක් ආරම්භ කර නොතිබුණි. ආරම්භ නොකර අතහැර දැමීමට බලපෑ සාධක දිස්ත්‍රික් ලේකම්ගේ පාලනයෙන් පරිබාහිර ඒවා බව ඔහුගේ පිළිතුරෙන් දක්වා තිබුණි.

(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් ආරම්භ කර තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය රු.1,372,154 ක් වූ ව්‍යාපෘති 05 කට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.479,375 ක් වැයකර තිබුණු අතර, ඇස්තමේන්තුගත පිරිවැය දක්වා නොතිබුණු ව්‍යාපෘතියකට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,200,000 ක් වැය කර තිබුණි. මෙම ව්‍යාපෘති 06 ම නිම නොකර අතහැර දමා තිබුණි.

4.10 ඉදිකිරීම් පිළිබඳ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජාංගනය ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කර තිබුණු ජාතික සවිය ගම නැගුම විශේෂ ව්‍යාපෘති 06 කින් ව්‍යාපෘති 02 ක නාමපුවරු 02 ක් වෙනුවෙන් වැඩිපුර ගෙවන ලද රු.12,000 ක් සහ ව්‍යාපෘති 03 කට අදාල ප්‍රමිතියෙන් තොරව ඉටුකර තිබුණු වැඩ අයිතම 03 ක එකතු වටිනාකම රු.629,828 ක් රැඳවුම් මුදලින් අයකරන බවට ප්‍රාදේශීය ලේකම් විසින් කරුණු දක්වා තිබුණු අතර, ව්‍යාපෘති 03 ක ඉදිකර තිබුණු එකතු වටිනාකම රු.18,000 ක් වූ නාම පුවරු 03 ක් කිසියම් පිරිසක් විසින් විනාශකර තිබුණි.

(ආ) රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගම නැගුම වැඩ සටහන යටතේ 2007 වර්ෂයේදී ආරම්භ කර රු.2,277,227 ක් දක්වා ඉදිකිරීම් කර තිබුණු බහුකාර්යය ගොඩනැගිලි 03 ක් ප්‍රමාණවත් අක් මුදල් නොලැබීම මත අත්හැර දමා තිබුණු අතර, භූමිය වල් බිහිවී මෙතෙක් සිදු කරන ලද ඉදිකිරීම් විනාශ වී යමින් තිබෙන බවද නිරීක්ෂණය විය.

(ඇ) ජාතික සවිය ගම නැගුම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 670, ආඩියාගල සති පොළ තුල වැසිකිළි පද්ධතිය ඉදිකිරීමට අදාල ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 13 ට අනුව අඟල් 14 ක විෂ්කම්භය සහිත පී.වී.සී. නල සපයා සවිකිරීමේදී දිග මීටර් 08 ක ප්‍රමාණයක් අධි ඇස්තමේන්තු කර රු.12,520 ක් වැඩිපුර ගෙවා තිබුණි.

4.11. කාර්ය සාධනය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පවරා ඇති මෙහෙවර හා කාර්යයන් ඉටු කිරීමට අදාළ සංයුක්ත සැලැස්මක්ද, එම සංයුක්ත සැලැස්මට අදාළව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් ඇතුළත් 2010 වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි.

4.12 අවිධිමත් ගනුදෙනු

අනුරාධපුර දිස්ත්‍රික් සමෘද්ධි අධිකාර කාර්යාලය විසින් ඇස්තමේන්තු වටිනාකම රු.8,095,012 ක් වූ සමෘද්ධි බැංකු 05 ක් ඉදිකිරීම වෙනුවෙන් අදාළ ඉඩම් විධිමත් පරිදි පවරා ගැනීමකින් තොරව 2010 දෙසැම්බර් 31 දිනට රු.5,987,079 ක් ගෙවා තිබුණ අතර ඇතැම් බැංකු ගොඩනැගිලි ඉදිකල ඉඩම් පවරා ගත නොහැකි ඒවා බවද අනාවරණය විය.

4.13 මෙහෙයුම් අකාර්යක්ෂමතා

නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ මෙහෙයුම් අකාර්යක්ෂමතා සාරාංශයක් පහත දැක්වේ.

(අ) විශ්‍රාමිකයා සහ යැපෙන්නා මිය ගොස් ඇති බැවින්, අයකර ගැනීමට නොහැකි නැගෙනහිර නුවරගම් පළාත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සාවද්‍ය ලෙස ගණනය කර වැඩිපුර ගෙවන ලද රු.68,536 ක විශ්‍රාම වැටුප් එකී වැටුප සාවද්‍ය ලෙස ගණනය කල නිලධාරීන්ගෙන් අයකර ගෙන නොතිබුණි.

(ආ) ඉපලෝගම හා ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු ලිපි ගොනු 949 කින් මූලික තොරතුරු නොමැතිවීම හේතුවෙන් ලිපිගොනු 181 ක විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 23 ට අදාළව අනුයුක්ත කර තිබුණු සමෘද්ධි නිලධාරීන් 89 දෙනෙකු විසින් ඔවුන්ගේ කාර්ය නිසි ලෙස ඉටුකර නොතිබීම හේතුවෙන්, සමෘද්ධි අධිකාරය විසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කළ 50% ක දායක මුදල් ආපසු අයකර ගැනීමේ පදනම මත සමෘද්ධි බැංකු සංගම් චක්‍රීය අරමුදලින් ණය ලබාදීමේ ව්‍යාපෘති 8714 ක් සඳහා 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ලබා දී තිබුණු රු.82,086,434 ක් වූ ණය මුදලින් 2010 දෙසැම්බර් 31 දිනට රු.17,011,483 ක මුදලක් අයවීම හිඟ හිට තිබුණි. එසේ වුවද, එකී අකාර්යක්ෂම නිලධාරීන්ගේ වැටුප් වර්ධක ද අනුමත කර ගෙවා තිබුණි.

(ඇ) දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි අඩු ආදායම්ලාභී පවුල්වල අවුරුදු 02 සිට 05 දක්වා වයස් ප්‍රමාණයේ දරුවන් සඳහා කිරි වීදුරුවක් ලබාදීමේ රජයේ ප්‍රතිපත්තිය කහටගස්දිගිලිය, තලාව, ගලෙන්බිඳුණුවැව, මහවිලච්චිය, ගල්නෑව, නොච්චියාගම හා මිහින්තලය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ක්‍රියාත්මක කිරීම සඳහා ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය විසින් රු.4,265,950 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එයින් රු.1,499,527 ක් පමණක් වියදම් කර ග්‍රාම නිලධාරී වසම් 228 කින් ග්‍රාම නිලධාරී වසම් 54 ක පමණක් එම වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණු බව නිරීක්ෂණය විය. කිරි සැපයුම්කරුවන් සොයා ගැනීම සහ බෙදාහැරීමේ අපහසුතාවය නිසා ව්‍යාපෘතිය අසාර්ථකවී ඇති බව දිස්ත්‍රික් ලේකම්ගේ පිළිතුරින් දක්වා තිබුණි.

(ඉ) ඉපලෝගම, මහවිලච්චිය, තිරප්පනේ හා රඹෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ මිලට ගෙන තිබුණු වටිනාකම ගණනය කළ නොහැකි පහත සඳහන් විවිධ භාණ්ඩ, කාර්යාල පරිශ්‍රයේ ගොඩගසා තිබුණු බව නිරීක්ෂණය විය.

| භාණ්ඩ වර්ගය | ප්‍රමාණය |
|---|---|
| ක්‍රීඩා උපකරණ | 56 |
| උදළු තල | 67 |
| වතුර ෆිල්ටර් | 15 |
| මල් බාල්දි | 8 |
| අත් මුල්ලු | 8 |
| පුටු | 8 |
| මදුරු දැල් | 19 |
| ජල ටැංකි | 9 |
| කබඩි | 2 |
| බංකු | 5 |
| ස්පීකර් සෙට් | 2 |

(ඊ) 2007 ජූලි 16 දිනැති අංක ස.අධි/10/ජා.සංගම්/චක්‍රීය අරමුදල දරන චක්‍රලේඛය ප්‍රකාර ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති වැඩසටහන යටතේ ලබාදුන්, ව්‍යාපෘති පිරිවැයෙන් 50% ක් අදාල ප්‍රතිලාභීන්ගෙන් ප්‍රතිපාදන ලබා දුන් මස සිට සමාන වාරික 10 කින් අයකර ගත යුතු වුවත්, නැගෙනහිර නුවරගම් පළාත, කහටගස්දිගිලිය, ඉපලෝගම, තලාව, තිරප්පනේ, ගල්නෑව සහ තඹුත්තේගම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක සමෘද්ධි ප්‍රතිලාභීන් 5086 දෙනෙකුගේ තත්ත්වය නගා සිටුවීම සඳහා 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයේදී ලබා දුන් ණය මුදලින් රු.7,727,864 ක මුදලක් අයකර ගැනීම ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි.

(උ) 1997 වර්ෂයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදුකල තක්සේරු වටිනාකම පදනම් කරගෙන ගලෙන්බිදුණුවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත්, රජයේ නිවාස 04 කින් රු.125 හා රු.250 බැගින් ආර්ථික කුලි අයකර තිබුණි.

(ඌ) නැගෙනහිර නුවරගම් පළාත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2010 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රතිපාදන වලින් තරුණයින් 13 දෙනෙකුට සැහැල්ලු වාහන රියදුරු බලපත්‍ර සහ තරුණයින් 03 දෙනෙකුට බර වාහන රියදුරු බලපත්‍ර ලබා ගැනීම සඳහා ලංකා ගමනාගමන මණ්ඩලය වෙත රු.114,000 ක් 2010 දෙසැම්බර් 31 දින චෙක්පතක් මගින් ගෙවා තිබුණු නමුත්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(එ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉකුත් වර්ෂයේ දී මිලදී ගෙන තිබුණු එකතු වටිනාකම රු.467,522 ක් වූ පරිගණක මුද්‍රණ යන්ත්‍ර 2 ක්, ජංගම දුරකථනයක් හා වායුසමීකරණ යන්ත්‍රයක් විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ (සටහන 1) හි 2010 ජනවාරි 01 දිනට ගැලපුම් කර දක්වා නොතිබුණි.

## 4.14 මානව සම්පත් කළමනාකරණය

(අ) අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු.

2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| i. | ජ්‍යෙෂ්ඨ මට්ටම | 72 | 52 | 20 |
| ii. | තෘතීයික මට්ටම | 46 | 17 | 29 |
| iii. | ද්විතීයක මට්ටම | 1349 | 1091 | 258 |
| iv. | ප්‍රාථමික මට්ටම | 225 | 196 | 29 |
| | එකතුව | 1692 | 1356 | 336 |

## 4.15 අභ්‍යන්තර පාලනය

ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ් රථය සඳහා සහ රඹෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත වාහන සඳහා ඉන්ධන ඇණවුම් නිකුත් කිරීමේදී ඉන්ධනවල අවශ්‍යතාවය පිළිබඳ විස්තර දැක්වෙන ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි.

මගේ අංකය:- එන්සී/ඒපී/ඒ/1758 2012 මැයි දින.

දිස්ත්‍රික් ලේකම්,
අනුරාධපුර.

ශීර්ෂ 274 - අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1546(6) ව්‍යවස්ථාව ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

යථෝක්ත වාර්තාවේ කෙටුම්පතක් මේ සමඟ එවා ඇත.

2. එම කෙටුම්පතෙහි සාවද්‍ය, එකඟවිය නොහැකි හෝ ප්‍රසිද්ධ කිරීම මහජන යහපතට පටහැනි වන්නේ යැයි අදහස් කරන කරුණු කිසිවක් වේ නම්, මෙම ලිපියේ දින සිට දින 10 ක් ඇතුළත මා වෙත දන්වන්නේ නම් මැනවි.

3. ඉහත සඳහන් පරිදි දින 10 ක් ඇතුළත ඔබෙන් පිළිතුරක් නොලද හොත්, කෙටුම්පත් වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ 2010 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කරන බව කරුණාවෙන් සලකන්න.

එම්.කේ.එල්.පද්මිණී
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත :- ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.